# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## ප්‍රසම්පාදන නිලධාරී

**තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පහත තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**රැකියා විස්තරය :**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)/ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිගේ අධීක්ෂණය යටතේ භාණ්ඩ හා සේවාවල පිරිවැය, ගුණාත්මකභාවය, කාලය, කල්පැවැත්ම සැලකිල්ලට ගනිමින් රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් සියලුම භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේ වගකීම දරයි.

**බාහිර (පහත 01 හෝ 02) :**

1. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, මූල්‍ය (Finance) / ගිණුම්කරණය (Accountancy) /සැපයුම් දම කළමනාකරණය (Supply Chain Management) / ව්‍යාපාර කළමනාකරණය (Business Management) / ලොජිස්ටික් කළමනාකරණය (Logistic Management) / වාණිජ (Commerce) / ව්‍යාපාර පරිපාලනය (Business Administration) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක්.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මාධ්‍ය (intermediate examination) සමත් වීම.

**අභ්‍යන්තර (පහත 01 හෝ 02) :**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ, කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන (Management Assistant Non Tec) කාණ්ඩයේ (MA 1-2) හෝ කළමනාකරණ සහකාර තාක්ෂණ (Management Assistant Tec) කාණ්ඩයේ (MA 2-2) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වැටුප් ප්‍රමාණය** : JM 1-2 (2016) Rs. 43,355/- 10 x 755 - 18 x 1,135 – Rs. 71,335/-

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟ විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**වෙනත් ප්‍රතිලාභ :**

i. පවතී නම් නවාතැන් (ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස) සපයනු ලැබේ හෝ නවාතැන් වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.

ii. ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයේ පවතින නීතිරීතිවලට අනුව වෛද්‍ය ප්‍රතිලාභ ලබාගත හැකිය.

iii. අර්ථසාධක අරමුදල: තෝරාගත් අපේක්ෂකයා වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු අතර, ආයතනය 15%ක් දායක වේ. ආයතනය සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ද ලබා දෙනු ඇත.

iv. තේ පර්යේෂණ ආයතනයේ තනතුර සඳහා අදාළ වන අනෙකුත් ප්‍රතිලාභ.

මෙම තනතුර ස්ථිර තනතුරකි. සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාව සමග උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වල පිටපත්, සේවා සහතික සහ අයදුම්කරු පිළිබඳව සොයා බැලිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග **2025 ජනවාරි 06 වැනි දින** හෝ ඊට ප්‍රථම පහත අත්සන් කර ඇති අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට අවකාශ ඇත. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය වැඩි විස්තර සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk පිවිසෙන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**ශාන්ත කුම්බිස්, තලවාකැලේ**